උපදෙස් පත්‍රිකා අංක: 2014/07

# ක්ෂේත්‍ර ස්ථාපනය හා අපරිනත වගා නඩත්තුව



ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

# ක්ෂේත්‍රයේ රබර් වගාව ස්ථාපනය කිරීම හා රැක බලා ගැනීම

## මෙය වැදගත් වනුයේ මන්ද?

ශ්‍රී ලංකාවේ රබර් වගාවන්හි නිෂ්පාදනය නියමිත තත්වයට වඩා අඩු අගයක පවතින බැවින් එයින් ලබා ගත හැකි ආදායමද අඩු අගයක් ගනී. මෙයට ප්‍රධාන හේතුව වනුයේ ඒකීය ක්ෂේත්‍රයක ඇති රබර් ගස් සංඛ්‍යාව නියමිත පරිදි නොමැති වීමයි.
මෙයට ප්‍රධාන හේතු ලෙස

- ගුණාත්මයෙන් උසස් බද්ධ රබර් පැළ භාවිතා නොකිරීම
- මුලික ශෂ්‍ය කටයුතු පහත් මට්ටමක පැවතීම
- රබර් පර්යේෂණායතනයේ නිර්දේශිත ක්‍රම අනුගමනය නොකිරීම
- මිය යන පැළ සඳහා නැවත පැළ නොසිටුවීම දැක්විය හැක.

වගාවක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කිරීමේදී එය උසස්ම තත්වයෙන් ඉටු කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතුය. මෙම උපදේශන පත්‍රිකාව මගින් එම අරමුණ ඉටු කර ගන්නා ආකාරය විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

## වගාවක ආරම්භක කටයුතු සංවිධානය කර ගැනීම

රබර් වගාව සඳහා ක්ෂේත්‍රය සකස් කර ගැනීමේ ආරම්භක කටයුත්ත වනුයේ බිම සකස් කර ගැනීමයි. නැවත රබර් වගා කිරීමේදී වගාව තුල මුල් රෝග පැතිර යෑම වලක්වා ගැනීම සඳහා නිර්දේශිත පිළිවෙත් අනුගමනය කිරීම ඉතා වැදගත්ය. විශේෂයෙන්ම සුදු මුල් රෝගය පැතිරී ගස් මියයාම වගාවේ තත්වය දුර්වල වීමට හේතු වේ. ආරම්භක කටයුතු වලදී භූමියේ ඇති සියලුම ගස් වර්ග මුල් සමග ගලවා භූමියෙන් ඉවත් කළ යුතුය.

පැරණි රබර් වගාවක ගස් ගලවා ඉවත් කරන්නේ නම් ඊට පෙර මුල් රෝග පැතිරී ඇති භූමි ප්‍රදේශ හඳුනා ගෙන එම ප්‍රදේශ සලකුණු කර ගත යුතුය. ලුණු මිශ්‍ර හුණු දියරයක් එම ප්‍රදේශය වටා ඇති ගල්වල ආලේප කිරීමෙන් එය පහසුවෙන් කර ගත හැක. මෙම ප්‍රදේශයේ ගල් නැතිනම් අවශ්‍ය ස්ථාන වල ගල් වළලා එහි හුණු දියරය ආලේප කිරීමෙන් මෙම කාර්ය ඉටු කර ගත හැකි වේ.

අනතුරුව සලකුණු කරනු ලැබූ ප්‍රදේශයේ ඇති පරණ රබර් ගස් ගැලවීමේ දී පැන්සල් ප්‍රමාණයේ මුල් පවා මුලමනින්ම ඉවත් කළ යුතුය. මෙම ප්‍රදේශයේ පමණක් නොව මුළු වගා භූමියේම කුඩා මුල් පවා හැකිතාක් දුරට ඉවත් කිරීම වඩාත් සුදුසු ය. මේ අවස්ථාවේ දී  මෙය සිදු නොකල හොත්, අනිවාර්යයෙන්ම අළුත් වගාවේ ගස් එකින් එක මැරී යාම සිදු වේ.

සාමාන්‍යයෙන් ගස් ගැලවීම ලීවරයක් (Monkey grubber) ආධාරයෙන් කළ හැක. භූමියේ ඇති ආසාදිත (රෝග වලට ගොදුරු වූ) හා අන් සියලුම මුල් කොටස් එක් ස්ථානයකට එකතු කර ගිනි තබා මුලමනින්ම පුළුස්සා දැමිය යුතුය. බැකෝ යන්ත්‍ර යොදා ගස් ගැලවීමේදී පස සංරක්ෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමුකල යුතුය. ගස් ගැලවීම ඊසාන දිග මෝසම් වැසි කාලයේ දී (ඔක්තෝම්බර්/නොවැම්බර්) පහසුවනුයේ පස තෙමී බුරුල් වී ඇති බැවින් ගස් සහ මුල් ගලවා ඉවත් කිරීම වඩාත් කාර්යක්ෂමව කළ හැකි නිසා ය. මෙම කටයුත්ත පෙබරවාරි මාසය වන විට සම්පූර්ණයෙන් නිමකර ඇත්නම් එම කාලයේ දී පවතින වියළි කාලගුණ තත්වය යටතේ ගස් වල ඉතිරි කොටස් (මුල් හා අතු කැබලි) ඉතා පහසුවෙන් ගිනි තබා ඉවත් කර දැමිය හැක. මොණරාගල වැනි අතරමැදි කලාපයේ ප්‍රදේශවල ගස් ගැලවීම මැයි/ජුනි මාසවල සිදු කළ හැක.

## සිටුවිය යුතු ගස් ප්‍රමාණය සහ පරතරයන්


වගා ස්ථාපනය සඳහා අනුමත පැළ ප්‍රමාණය හෙක්ටයාරයකට පැළ 510 - 520ක් වේ. දැනට නිර්දේශිත පැළ හා පේළි අතර පරතර පහත පරිදි වේ (රූපය 1).

- මීටර් 4.3 x මීටර් 4.5 - හතරැස් ක්‍රමය
- මීටර් 3.5 x මීටර් 5.5 - පේළි ක්‍රමය 1
- මීටර් 2.5 x මීටර් 7.75 - පේළි ක්‍රමය 11
- මීටර් 3.0 x මීටර් 3.0 x මීටර් 18.0 - ද්විත්ව පේළි ක්‍රමය*

* ද්විත්ව පේළි අතර පරතරය මීටර් 18.0 විය යුතුය (තේ, කුරුඳු වැනි අතුරු බෝග සඳහා)

පේළි ක්‍රමයට සිටුවීමේදි, කිරි කැපුම්කරුට ගසින් ගසට යෑමට ගතවන කාලය අඩු බැවින් කිරි කැපීමට ගත වන කාලය අඩු කර ගත හැක. තවද මීටර් 2.5 x මීටර් 7.75 පරතරය අතුරු භෝග යෙදීමට බලාපොරොත්තු වන ඉඩම් සඳහා විශේෂයෙන් නිර්දේශ කෙරේ.

කෙසේ වුවද, නැවත වගාවක පැළ සිටුවීමේදී පළමුව භාවිතා කරන ලද පරතරය වෙනස් කොට අනෙක් නිර්දේශිත පරතර දෙකෙන් එකක් භාවිතා කිරීමෙන් සුදු මුල් රෝගය වැළඳීමේ අවදානම අඩු කර ගත හැක.





| | | |
|---|---|---|
| මීටර් 4.3 x මීටර් 4.5<br>හෙක්ටයාරයකට ගස් 516 | මීටර් 3.5 x මීටර් 5.5<br>හෙක්ටයාරයකට ගස් 519 | මීටර් 2.5 x මීටර් 7.75<br>හෙක්ටයාරයකට ගස් 516 |

**රූපය 1.** පැළ හා පේළි අතර පරතයන්

## පැළ සිටුවීම සඳහා පේළි ලකුණු කර ගැනීම

කඳු බෑවුම් සහිත භූමියක වලවල් ලකුණු කිරීමේ දී එය සමෝච්ඡ රේඛා ඔස්සේ කළ යුතුය. පේළි ලකුණු කිරීමට ගන්නා උපකරණයක (Road tracer) ආධාරයෙන් වලවල් ලකුණු කරන්නේ නම් එහි පහත්ම ස්ථානයෙන් පටන්ගෙන

එක් දිසාවකට විහිදී යන සේ ලකුණු කිරීම කළ යුතුය. මෙමගින් නොකැඩෙන සමෝච්ඡ රේඛාවන් ඔස්සේ වලවල් ලකුණු කිරීම කළ හැකිවේ. මෙසේ කිරීමේ දී පේළි දෙකක් අතර පරතරය එහි නියම පරතරයට වඩා දෙගුණයකට වඩා වැඩි නම් පමණක් අතිරේක පේළියක් (කෙටි පේළියක්) ලකුණු කළ හැකි වේ. එහෙත් එක දිගට ඇති පේළි අතර මෙවැනි අමතර කෙටි පේළි දැමීම හැකිතාක් දුරට අඩුකර ගත යුතුය (රූපය 2).



**රූපය 2.** කඳු බෑවුම් ප්‍රදේශයක පේළි ලකුණු කිරීම

## වලවල් කැපීම හා පිරවීම

රබර් නැවත වගාවක පේළි වෙනස් කරන්නේ නම් ගස් ඉදිරීමට පෙර වලවල් කැපිය හැක. මෙවැනි අවස්ථාවක උදුරන ලද ගස්වල මුල් අළුත් වලවල් වලට නොවැටීමට ස්ථිර වශයෙන් වග බලා ගැනීම ඉතා වැදගත් වේ. වලක ප්‍රමාණය අඩි 2ක් දිග, අඩි 2ක් පළල සහ අඩි 2 ½ ගැඹුර විය යුතුය (සෙ.මී. 60 x 60 x 75). වල සලකුණු කළ ස්ථානය ගල් සහිත නම් සලකුණ සුළු ප්‍රමාණයක්

වෙනස් කර වල හාරා ගත යුතුය. වල පිරවීම සඳහා ගල් සහ මුල් කැබලි වලින් හෝ වෙනත් අපද්‍රව්‍ය වලින් තොර මතුපිට පස් භාවිතා කළ යුතුය. පැළ සිටුවීමට මසකට පමණ පෙර වලවල් සකස් කර පුරවා සාමාන්‍ය ආකාරයට තද වීමට ඉඩ හැරිය හැක. නමුත් කම්කරු හිඟයක් පවතින අවස්ථාවන්හිදී පමණක් වලවල් පිරවීම, පැළ සිටු වන අවස්ථාව දක්වා ප්‍රමාද කළ හැකිය (රූපය 3).

***පොලිතින් මළු පැළ, එනම් ළපටි බද්ධ පැළ සිටුවීමට පෙර වලට පොහොර යෙදීම අවශ්‍ය නොවේ.***



**රූපය 3.** පැළ සිටුවන අවස්ථාවේදීම වල වැසීම

## පැළ සිටුවීමේ කාලය

රබර් වගාව ස්ථාපිත කිරීම සාමාන්‍යයෙන් මෝසම් වැසි ආරම්භයත් සමග කළ යුතුය. ප්‍රධාන වශයෙන් මෝසම් වැසි කාල දෙකකට වෙන් කළ හැකිය. එනම් මැයි-ජූනි මාස වල පවතින නිරිත දිග මෝසම් වැසි සහ ඔක්තෝබර්-නොවැම්බර් මාස වල පවතින ඊසාන දිග මෝසම් වැසියි. මෙයින් ඊසාන දිග මෝසම් වැසි ඉතා කෙටි කාලයකින් අවසන් වේ. මේ නිසා වැඩි කාලයක් පැතිරී පවතින නිරිත දිග මෝසම් වැසි (මැයි-ජූනි) ආරම්භයේ පැළ සිටුවීම ඉතා යෝග්‍ය වේ. එහෙත් මොණරාගල වැනි අතර මැදි කලාපයේ නිරිත දිග මෝසම් වැසි අඩු බැවින් පැළ සිටුවීම ඊසාන දිග මෝසම ආරම්භයේ දී කළ යුතුය.

## රෝපණ ද්‍රව්‍ය

රබර් වගාවක් ස්ථාපනය කිරීම සඳහා නිර්දේශිත රෝපණ ද්‍රව්‍යය වනුයේ ළපටි බද්ධ පැළයි. එනම්, ප්‍රරෝහණය වූ බීජ පොලිතින් මළු තුළ සිටුවා හරිත බද්ධය සිදු කොට ලබා ගන්නා පැළයි. ***පැළ මියයාම, හොඳ පැළ තෝරා ගැනීමට නොහැකිවීම සහ සිටවන අවස්ථාවේදී පැළ වල වයස අවුරුදු 2 ක් පමණ වන නිසා යන කරුණු මත නග්න මූල බද්ධ පැළ ස්ථාපනය නිර්දේශ නොකෙරේ.***

***ඉතාමත්ම හොඳ රෝපණ ද්‍රව්‍ය ලෙස ළපටි බද්ධ පැළ සැලකීමට හේතු වනුයේ ළපටි බද්ධ පැළ වල හොඳ මූල පද්ධතියක් තිබීම සහ මාස 9-10 වැනි කාලයකදී, කොළ මාල 2 ක් සහිත පැළ ලබා ගැනීමට ඇති හැකියාවයි. ක්ෂේත්‍රයේ සිටුවන අවස්ථාව වන විට පැළ වල වයස අවුරුද්ද නොඉක්මවිය යුතුය. එවැනි පැළ වල, මුල් අවුරුදු 4-5 තුළ දී මනා වර්ධනයක් දැකිය හැකි වේ. බද්ධය සාර්ථක වූ පැළ අතුරින් 25%ක් පමණ දුර්වල පැළ ලෙස තෝරා ඉවත් කළ යුතුයි.***

ළපටි බද්ධ පැළ භාවිතයෙන් ක්ෂේත්‍රයේ ස්ථාපනය සියයට සියයක සාර්ථකත්වයකින් සිදු කර ගත හැකිවාක් මෙන්ම බොහෝ දුරට පැළ වල ඒකාකාරි වර්ධනයක්ද ලබා ගත හැක.

## ළපටි බද්ධ පැළ සිටුවීම

ඉහළම කොළ මාලය මේරූ පැළ පමණක් ක්ෂේත්‍රයේ ස්ථාපනය සඳහා රැගෙන යා යුතුය. පැළ ක්ෂේත්‍රයට රැගෙන යාමට සති 4-6 ට පමණ පෙර පොහොර යෙදීම නවතා දැමීමෙන් මෙවැනි ඉහළ කොළ මාලය මේරූ පැළ සංඛ්‍යාව ඉහළ නංවා ගත හැකිය.

පැළ වල අග්‍රස්ථය වර්ධනය වෙමින් පවතින අවස්ථාවේදී හෝ කොළ වල වර්ණය දුඹුරු හෝ ලා කොළ පැහැයේ දළු පවතින අවස්ථාවන්හිදී ක්ෂේත්‍රයට රැගෙන යාමෙන් වැලකිය යුතුය (රූපය 4). මෙවැනි පැළ ක්ෂේත්‍රයේ සිටවූ පසු අග්‍රස්ථය ඉහළ සිට පහළට මැරී යාම, වර්ධනය අක්‍රමත් වීම හා පාලු ඇති වීම යන අවස්ථාවන්ට ලක් විය හැක.



**රූපය 4.** අපරිණත කොළ මාලයක් සහිත පැළ

සාමාන්‍යයෙන් තවානකින් ක්ෂේත්‍රයට පැළ රැගෙන යන අවස්ථාව වන විට එම පැළ වල මුදුන් මුල බෑගයෙන් පහළ පස තුලට වර්ධනය වී ඇත. එබැවින් පැළ සිටුවීමට දින 10 කට පමණ පෙර බෑගය ප්‍රවේශමෙන් පැත්තකට ඇල කොට මුවහත් පිහියක ආධාරයෙන් මුදුන් මුල කපා පොළොව සමග ඇති සම්බන්ධතාවය නැති කල යුතුය (රූපය 5). මෙය සිදු කිරීමේදී ද පැළ වල ඉහළ කොළ මාලය මෝරා තිබිය යුතුය. මුල කැපූ අවස්ථාවේ සිට සිටුවන අවස්ථාව දක්වා පැළයට හොඳින් ජලය යෙදිය යුතුය.

නමුත් පැළ ප්‍රවාහනය කරන අවස්ථාවේදී බෑගය ජලයෙන් පෙඟී තිබුන හොත් බෑගයේ ඇති පස් සෙලවීමෙන් මූල පද්ධතියට හානි සිදුවිය හැක. මෙය වලක්වා ගැනීම සඳහා පැළ ප්‍රවාහනයට සුදානම් කළ පසු ජලය නොදැමිය යුතුය.



**රූපය 5.** මුවහත් ආයුධයක් මගින් මුදුන් මූල කපා ඉවත් කිරීම

පැළ ක්ෂේත්‍රයට ප්‍රවාහනය කිරීමේදී පැළ එකිනෙකට ලංව ඇසිරීමෙන් බෑගය තුළ ඇති පස් සෙලවීම හා හැලීම අවම කර ගත හැකිය.

පැළ සිටුවීමේ දී වලෙහි අවශ්‍ය ගැඹුර සකසා ගැනීම සඳහා අවශ්‍ය වන පරිදි පස් ඉවත් කිරීම හෝ එකතු කිරීම කළ හැක.



**රූපය 6.** බෑගය ද සහිතව කඳ සෙ.මි. 15-20 ක් යට වන ලෙස පැළය සිටුවීම

පැළ සිටුවීමේදී බිම් මට්ටමෙන් සෙ.මී. 5-10 ක් පහළින් බද්ධ සන්ධිය පිහිටිය යුතුය. තවද, කොළ මාල 2-3 දක්වා වැඩී ඇත්නම්, පැළයේ කඳ පළමු කොළ මාලය දක්වා (සෙ.මි.15-20 පමණ) පසට යට කළ හැක (රූපය 6). මෙම ක්‍රමය භාවිතා කිරීමෙන් කිරි කැපුම් කට්ටය බිම් මට්ටමට ළගා වීමේ දී බද්ධ සන්ධිය ආසන්නයේ ඇති ග්‍රාහකයෙන් (බද්ධ සන්ධියෙන් පහළ කොටස) අස්වැන්නට ඇති කරන බලපෑම අවම කර ගත හැක. එමෙන්ම මෙහිදී ද මූලික පොහොර මිශ්‍රණයන් වලට යොදන්නේ නැත.

පළමු කොල මාළය දක්වා සිටවු පැලයක් වසරකට පසුව වර්ධනය වී ඇති අයුරු රූපය 8 හි දැක්වේ.

පැල සිටුවිමේ නවතම නිර්දේශය වනුයේ පොලිතීන් බෑගය සමග පැළ සිටුවීමයි. මූල පද්ධතියට හානි සිදුවීම අවම කිරීම මෙහි අරමුණයි. මෙහි දි පොලිතීන් බෑගයේ පතුල මුවහත් පිහියක ආධාරයෙන් කපා ඉවත් කළ යුතුය (රූපය 7). වියලි කාලගුණයක් සහිත ප්‍රදේශ වල මෙන්ම තමාගේ කැමැත්ත පරිදි, බෑගය ඉවත් කර සිටුවිමද නිර්දේශයයි.



රූපය 7. බැගයේ පතුල කපා ඉවත් කිරීම



රූපය 8. පළමු කොළ මාලය දක්වා පසට යට කර සිටුවන ලද ළපටි බද්ධ පැළයක් (වසරකට පසු)

බැගය ඉවත් කර සිටුවීමේදී පළමුවෙන් පතුල කපා බැගය සහිත පැළය වල මැදින් තැබිය යුතුයි. ඉන්පසු, පතුලේ සිට බැගයේ උසින් අඩක් දක්වා, පොලිතින් කැබැල්ල පමනක් කැපෙන ලෙසට ඉහළට කැපුමක් යෙදිය යුතුයි. ඉන්පසු ඒ මට්ටම තෙක් පස් යොදා වල පුරවා කැපුම බැගයේ කර දක්වා දික් කල යුතුයි. ඉන්පසු සම්පූර්ණ වල පස් දමා පුරවා කැපූ පොලිතින් බැගය ඉහළට ඇද ඉවත් කල යුතුයි. බැගයට කැපුම යොදන අවස්ථාවේ, බැගය අසල පස මතුපිට ඇති මුල්වලට හානි නොවන ලෙසට සිදු කිරිමට වග බලා ගතයුතුයි.

පැළය සිටුවීමෙන් පසු පැළය අවට ඇති පස් තදින් තෙරපීම සිදු නොකල යුතුය. (පස් තදින් තෙරපීම හේතු කොට ගෙන මූල පද්ධතියට හානි සිදුවිය හැක). බෑගය සහිතව සිටවූ පැළයක් වසර තුනකට පසු වර්ධනය වී ඇති අයුරු රූපය 9 හි දැක්වේ.

ඉහත සඳහන් පරිදි සැලකිලිමත්ව මූල පද්ධතියට හානි නොවන අයුරින් පැළ සිටුවා ගැනීමෙන් පැළ මිය යාම සියයට සීයකින් වලක්වා ගත හැකි අතර, නොකැඩුන ඒකාකාරී වර්ධනයක් සහිත සාර්ථක වගාවක් ස්ථාපනය කර ගත හැක.



**රූපය 9**. පොලිතීන් බෑගය සමග සිටුවන ලද පැළයක් (වසර 3 ට පසු)

# ක්ෂේත්‍රයේ රැක බලා ගැනීම


## පළමු සති 4 - 6 අතර කාලය

සාමාන්‍යයෙන් පැළ සිටුවීම සිදු කරනුයේ වැසි කාල වලදී වුවද, පැළ සිටුවීමෙන් පසුව දිගින් දිගටම වියළි කාළගුණයක් පවතී නම්, පැළ වලට ජලය සැපයීම කළ යුතු අතර, පැළය වටා පස සුදුසු ද්‍රව්‍යයකින් (වැට මාර කොළ, පිදුරු වැනි) ආවරණය කළ යුතුය(වසුන් යෙදීම).

ක්ෂේත්‍රයේ සියළුම පැළ සතිපතා පරීක්ෂා කළ යුතු අතර, ග්‍රාහක අංකුර ලියලා ඇති නම් ඒවා සියල්ල කපා ඉවත් කළ යුතුය. බද්ධ අංකුරය අතු බෙදීමකින් තොරව අඩි 8ක් (මීටර් 2.5ක්) පමණ උසට වර්ධනය වීමට ඉඩ හළ යුතුය. මෙහිදී, වර්ධනය වන්නාවූ පාර්ශ්වික අංකුර ඇතොත් ඒවා කපා ඉවත් කිරීම කළ යුතුය.

## වාර වූ පැළ සහ ඒ සඳහා යොදාගත යුතු පැළ

කුමන හෝ හේතුවක් නිසා වාර වන පැළ සඳහා පුරප්පාඩු පිරවීම හැකි ඉක්මනින්ම සිදු කළ යුතු වේ. අවුරුදු 2 - 3 දක්වා කාලයකට පසු වාර වීම සිදු වුයේ නම්, එබඳු විටක හිස්තැන් පිරවීම සඳහා අවුරුදු 2-3 වයසැති පැළ යොදාගත යුතු වේ. මේ සඳහා වගාව ආරම්භයේදීම වගාවේ ඇති ගස් ප්‍රමාණයෙන් 10% ක් පමණවූ අමතර පැළ සංඛ්‍යාවක් නඩත්තු කිරීම අවශ්‍ය වේ. මෙලෙසට වැඩිපුර තබා ගත යුතු පැළ, පැළ සිටවූ ඉඩමේම ගස් අතර රූපය 10 හි ආකාරයට සිදු කල හැකිය. රබර් ගස් අතර තරගයක් හට ගැනෙනුයේ වසර 3 කට පමණ පසුව බැවින් පලමු වසර 2½ තුලම මෙලෙසට පවත්වා ගන්නා ගස් යොදා ගෙන සියළුම පාළු ස්ථාන පිරවිය යුතුයි. ඒවා ක්ෂේත්‍රයට හඳුන්වා දීම මෝසම් වැසි ආරම්භයේදී කළ යුතු වන අතර කේෂ්ත්‍රයේ ස්ථාපනයට සති 5-6 කට පමණ පෙර පැළය තබා ඇති ස්ථානයේදීම පස් විසිරී නොයනසේ පැළයේ මුල එක් පැත්තකින් හාරා මුදුන් මුල අඩි 2ක් පමණ දිගට සිටිනසේ පහලින් කැපිය යුතුය. ඊට සති 3 කට පමණ පසුව කඳ කොටසත් කප්පාදු කළ යුතුය (අඩි 8 ක් ඉහළින්). නවත් සති 2 කින් පමණ (පාර්ශ්වික අංකුර හට ගන්නා විට) ක්ෂේත්‍රයේ සිටුවිය යුතු වේ. මේ ආකාරයට සිටුවන පැළ මුහුකුරා ගිය බද්ධ පැළ හෙවත් stumped buddings ලෙස හඳුන්වයි රූපය 11.



● ස්ථිර පැළ

X - පාළු සිටුවීමට පැළ

**රූපය 10.**



**රූපය 11.** මුහුකුරා ගිය බද්ධ පැළ නිපදවීම

විශේෂයෙන්ම වගාවේ දෙවන සහ තෙවන අවුරුදු වලදී, දුර්වල පැළ ගලවා ඉවත් කර ඒ වෙනුවට සිටුවීම සඳහා මුහුකුරා ගිය බද්ධ පැළ යොදා ගත හැක. වසර 2½ වන තුරු පස් වතාවක් මෙලෙසට පාළු සිටුවීම සිදු කල හැකි අතර, වසර 2½ අවසානයේ සියලු තාවකාලික ගස් ගලවා ඉවත් කල යුතුයි.

## පාර්ශ්වික අතු උත්තේජනය (Branch Induction)

ශ්‍රී ලංකාවේ නිර්දේශිත බොහෝ ක්ලෝනයන්ගේ ශාක වල අතු බෙදීම ස්වභාවිකවම සිදුවේ. එසේ වුවත් RRIC 121 සහ වෙනත් ක්ලෝන කිහිපයක අතු බෙදීම සඳහා කෘතිම උත්තේජනයක් ලබාදීමට සිදුවන අවස්ථා ඇත. ශාකයක වයස අවුරුදු 2 ක් ඉක්මවූ පසුවත් අඩි 8 - 10 ක් (2.5 - 3.0m) උසින් අතු බෙදීමක් දක්නට නොමැති නම් ඒ සඳහා ශාකය උත්තේජනය කල යුතුය.

මේ සඳහා ශාකයේ අග්‍රස්ථය තාවකාලිකව ආවරණය කල යුතුය. මෙය පත්‍ර කිහිපයකින් අග්‍රස්ථය ආවරණය කිරීම (leaf cap method) සහ ශාකයේ ඉහළ කොළ මාලයේ ඇති පත්‍ර කිහිපයක් නමා අග්‍රස්ථය ආවරණය කිරීම (leaf folding method) යන ක්‍රම දෙක මගින් සිදු කල හැකිය.

ශාකයේ ප්‍රධාන අග්‍රස්ථ අංකුරය ශාකයේ මුළු ජීවිත කාලය තුලම ආරක්ෂා වී තිබීම ඉතා වැදගත් වන අතර, අතු බේදීම උත්තේජනය සඳහා අග්‍රස්ථයට හානි කිරීම, ඉවත් කිරීම හෝ පොලිතින් වැනි ආවරණයක් යෙදීම කිසි විටෙක සිදු නොකල යුතුය.

අපරිනත ශාකයන්හී කඳෙහි වර්ධනය සලකා බැලිමේදී, හොඳින් අතු බේදී ඇති ගස්වල කඳෙහි වර්ධනය අතු නොබෙදුන ගස් වලට වඩා වැඩි බව පෙනේ.

## පත්‍ර නැමීමේ ක්‍රමය (leaf folding method)

අග්‍රස්ථ කොළ මාලය හොඳින් පරිණත හෝ අර්ධ වශයෙන් පරිණත වු විට මෙම ක්‍රමය යොදා ගත හැක.

මෙම ක්‍රමයේදී අග්‍රස්ථයේ කොළ කීපයක් අග්‍රස්ථය මැදි වනසේ රබර් පටියක් ආධාරයෙන් රඳවා තැබිය යුතුය (රූපය 11).



**රූපය 11.** පත්‍ර නැමීමේ ක්‍රමය (leaf folding method)

## පත්‍ර මගින් ආවරණය කිරීමේ ක්‍රමය (leaf cap method)

අග්‍රස්ථයේ ළපටි දළු මතුවන අවස්ථාවක හෝ අග්‍රස්ථ පත්‍රිකා ඉතා ළපටි අවධියක ඇති අවස්ථාවක මෙම ක්‍රමය යොදා ගත හැක. මෙහිදී මේරූ පත්‍රිකා 3ක් හෝ 4ක් ගෙන එකට තබා අග්‍රස්ථය ආවරණය වනසේ කොප්පුවක ආකාරයට පහළට නවා, රබර් පටියක ආධාරයෙන් රඳවා තැබිය යුතුය (රූපය 12).



**රූපය 12**. පත්‍ර මගින් ආවරණය කිරීමේ ක්‍රමය (leaf cap method)

මෙම ක්‍රම දෙකෙහිදීම ස්වභාවික ලෙස මෙම ආවරණයන් ඉවත් නොවුනේ නම් සති 3 - 4 කට පසු එය ඉවත් කල යුතුය. මෙහිදී ශාකයේ ඉහළම කොළ මාලයේ ඇති කක්ෂීය අංකුර පාර්ශ්වික අතු ලෙස පැන නගී. ඉන් අතු 5 - 6 කට පමණක් වර්ධනය වීමට ඉඩ හැර නොපමාව අනිකුත් අතු කපා ඉවත් කල යුතුය.


## වැදගත් කරුණු කිහිපයක්

- ශාකවල හා වගාවේ ඉදිරි පැවත්ම මුළුමනින්ම රඳා පවතිනුයේ, එහි අපරිණත අවධියේ, එනම් ළපටි කාලයේ වර්ධන තත්වය හා රැක බලාගන්නා ආකාරය මතය.

- භාවිතා කරණු ලබන ක්ලෝනය හා රෝපණ ද්‍රව්‍යයන්හි ගුණාත්මක භාවය අවසන් ඵලදාව තීරණය කිරීම සඳහා බලපාන ප්‍රධාන සාධක වේ.

- කෙසේ වුවද, භූමියේ තත්වය හා අපරිණත කාලය තුල පිළිපදින කෘෂි කළමණාකරන පිළිවෙත්, ශාකයේ වර්ධනය සඳහා බෙහෙවින් බලපායි.

- රබර් ශාක ශක්තිමත්ම හා වේගවත් ලෙස වර්ධනය වනුයේ එහි අපරිණත එනම්, ළපටි කාලයේදී පමණක් බව අවධාරණය කර ගත යුතු වේ. එබැවින් ශාකයේ අපරිණත කාලයේදී කඳෙහි වට ප්‍රමාණය වසරකට අවම වශයෙන් සෙ.මි. 10 කින් (අඟල් 4 ක) වැඩි කර ගැනීම සඳහා කළ යුතු සියළුම ආයෝජන හා කැප කිරීම් එම කාලය තුල දී සිදු කළ යුතු වේ (රූපය 13).




**රූපය 13.** අපරිනත කාලය තුලදී ලබා ගත යුතු වර්ධනය